# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1991 අංක 18 දරන
## රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.50 යි.    තැපැල් ගාස්තුව : රු. 1.55 යි.

**1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත**

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 70/89

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එහි සියලු විධිවිධාන සම්බන්ධයෙන් හෝ එහි යම් විධිවිධාන සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි දිනයක හෝ දිනවල සිට ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පිහිටුවීම

*රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පිහිටුවීම.*

**2.** (මෙහි මින් මතු " කොමිෂන් සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර එම කොමිෂන් සභාව 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තත්කාලයෙහි කොමිෂන් සභාවේ සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

*කොමිෂන් සභාව සංස්ථාවක් වන බව.*

**3.** කොමිෂන් සභාව, 2 වන වගන්තියේ ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර ඊට අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද කොමිෂන් සභාව විසින් ද කොමිෂන් සභාවට විරුද්ධව ද එම නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

*කොමිෂන් සභාවේ මුද්‍රාව.*

**4.** කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාව විසින් තීරණය කර සැලසුම් කළ හැකි අතර කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

*කොමිෂන් සභාවේ සාමාජිකයෝ.*

**5.** (1) කොමිෂන් සභාව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් සයදෙනෙකුගෙන් සමන්විත වන්නේ ය. (මෙහි මින් මතු " සභාපතිවරයා " යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස, ඉන් එක් සාමාජිකයකු, ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන්නේ ය.

(2) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා කොමිෂන් සභාවේ ලේකම්වරයා විය යුතු ය.

*කොමිෂන් සභාවේ අරමුණු.*

**6.** කොමිෂන් සභාවේ පොදු අරමුණු, පහත දැක්වෙන අරමුණු විය යුතු ය :—

(අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියාකිරීම පිළිබඳව විමසිලිමත් වීම සහ අධීක්ෂණය කිරීම ;

2—ඩී 011579—5,830 (90/11)

(ආ) (මෙහි මින්මතු "අදාළ භාෂාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ භාවාර්ථයට සහ චේතනාවට අනුකූලව සිදු වන බවට වග බලාගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම ;

(ඇ) රාජ්‍ය භාෂා අගයීම දිරිගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිත කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙන යාම ;

(ඈ) සිය මෙහෙයීමෙන් සහ ලැබෙන යම් පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් යන දෙආකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධානවලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම.

කොමිෂන් සභාවේ බලතල.

7. කොමිෂන් සභාවට—

(අ) අදාළ භාෂාවලින් යම් භාෂාවක තරාතිරම හෝ භාවිතය කෙරෙහි බලපාන්නා වූ හෝ බලපෑ හැකි යම් නියෝග, විධාන හෝ පරිපාලන පරිචය සම්බන්ධයෙන් සමාලෝචන මූලාරම්භ කිරීම ;

(ආ) අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි අධ්‍යයන හෝ ප්‍රතිපත්ති ප්‍රකාශන නිකුත් කිරීම හෝ යොදා ගැනීම ;

(ඇ) අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය සම්බන්ධයෙන් යෝග්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි ප්‍රකාශනවලට හෝ වෙනත් ජනමාධ්‍ය නිරූපණවලට අනුග්‍රහය දීම හෝ ඒවා ආරම්භ කිරීම ඇතුළුව පොදු අධ්‍යාපනික ක්‍රියාකාරකම්වල නිරතවීම ;

(ඈ) යම් චංචල හෝ නිශ්චල දේපළ මිලදී ගැනීමෙන් හෝ අන්‍යාකාරයෙන් අත්කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ; සහ

(ඉ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික නැතහොත් කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම

සඳහා බලය ඇත්තේ ය.

කාරක සභා පත් කිරීම.

8. (1) කොමිෂන් සභාවේ කාර්ය ඉටු කිරීමෙහි ලා සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත කාරක සභා, කොමිෂන් සභාව විසින් කලින්කල පත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද එවැනි යම් කාරක සභාවක සභාපතිවරයා කොමිෂන් සභාවේ සාමාජිකයකු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කාරක සභාවකට, කොමිෂන් සභාව විසින් (මේ උපවගන්තියෙන් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලය හැර) ස්වකීය බලතල අතුරින් සුදුසු යැයි කොමිෂන් සභාව සලකන බලතල පවරා දෙනු ලැබිය හැකි නමුත් එසේ පවරා දෙනු ලැබීම නොසලකා ඒ යම් බලයක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

**9.** (1) මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ කලින් ධුරය හිස් කළහොත් මිස, සභාපතිවරයා ද ඇතුළුව කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු පත් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දරන අතර නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතු ය :

එසේ වුව ද මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් ධුරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කරන ලද සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

ඉල්ලා අස්වීම සහ ශ්‍රී ලංකාවෙන් තාවකාලිකව බැහැරව සිටීම.

**10.** (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින්, ඔහු ධුරයෙන් ඉල්ලා අස්වන බවට ඔහුගේ අත්සනින් වූ ලිපියක් ජනාධිපතිවරයා වෙත යැවීමෙන් කවර වේලාවකදී වුවද ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් ලියවිල්ලක් මගින් පිළිගනු ලැබූ විට, ක්‍රියාත්මක වන්නේ ය.

(2) සභාපතිවරයාට හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකුට, රෝගාතුරවීම නිසා හෝ අබලතාව නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන්නේ නම්, එම නොහැකියාව පිළිබඳව ජනාධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දීම ඒ සාමාජිකයාගේ කාර්යය වන්නේ ය. එවිට අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියා කිරීමට සුදුසු සාමාජිකයකු හෝ ඒ වෙනත් සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු හෝ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

පාරිශ්‍රමික.

**11.** කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සෙසු සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයන් සහ දීමනා කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

රැස්වීම.

**12.** (1) සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීමේ මූලසුන දැරීම සඳහා, තමන් අතුරෙන් සාමාජිකයකු තෝරා පත් කර ගත යුතු ය

(2) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් සිව් දෙනෙකු විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි වේලාවක දී සහ ස්ථානයක දී, අවශ්‍ය වන පරිදි විටින් විට ද කෙසේ වෙතත් එක් එක් මාසයෙහි යටත් පිරිසෙයින් එක් වරක් වන පරිදි ද කොමිෂන් සභාව රැස් විය යුතු අතර, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ රැස්වීම් පිළිබඳ සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය පිළිබඳ කාර්ය විධානය විධිමත් කර ගත යුතු ය.

## II වන කොටස

### කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධරයා.

13. (1) සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වන්නේ ය.

(2) මේ වගන්තියෙන් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල හැර මේ පනතින් පැවරී ඇති කවර හෝ බලතල, කොමිෂන් සභාව විසින්, යෝජනා සම්මතයක් මගින් සභාපතිවරයාට පැවරිය හැකි අතර එසේ පවරනු ලැබූ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී සභාපතිවරයා, කොමිෂන් සභාවේ පොදු හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

(3) සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වුව ද ඔහු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන්නාක් සේ සැලකිය යුතු ය.

(4) සභාපතිවරයා විසින්, කොමිෂන් සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු පාලනය භාරව සිටීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ යම් නිලධරයකු හෝ නාමෝද්දේශනය කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය පත් කිරීම යනාදිය.

14. (1) ස්වකීය කටයුතු නිසි පරිදි හා කාර්යක්ෂමව කරගෙන යාම සඳහා අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකන යම් නිලධරයන් සහ සේවකයන්, කොමිෂන් සභාව විසින් පත් කරගත හැකි ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්—

(අ) කොමිෂන් සභාවේ කවර හෝ නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් විනය පාලනය ද කවර හෝ නිලධරයකු හෝ සේවකයකු සේවයෙන් පහ කිරීම ද කළ හැකි ය;

(ආ) ආයතන අධ්‍යක්ෂවරයා සහ මහා භාණ්ඩාගාරයේ (අයවැය) අධ්‍යක්ෂ විමසා, ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික හෝ නියම කළ හැකි ය ;

(ඇ) ඒ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ සේවා කොන්දේසි සහ නියමයන් නිශ්චය කළ හැකිය ; සහ

(ඈ) කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය පිණිස අර්ථ සාධක අරමුදල් සහ වෙනත් සුභ සාධක යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කළ හැකි අතර, එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක විය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**15.** (1) රජයේ සේවයේ නියුක්ත කවර හෝ නිලධරයකු, ඒ නිලධරයාගේ සහ ඒ නිලධරයා සේවයේ නියුක්ත කර ඇත්තේ යම් අමාත්‍යාංශයක් විසින් හෝ යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා කොමිෂන් සභාවට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආණ්ඩුව ප්‍රමාණවත් අරමුදල් සැපයිය යුතු බව.

**16.** කොමිෂන් සභාවට, මේ පනත යටතේ එහි බලතල ක්‍රියාවේ යෙදීමට සහ කර්තව්‍ය ඉටු කිරීමට හැකිවීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් කොමිෂන් සභාවට ලබා දිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**17.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂ යම විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් සහ වෙනත් සියලු මූල්‍ය ගණුදෙනු කටයුතු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට කොමිෂන් සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## III වන කොටස

## කොමිෂන් සභාව විසින් පැමිණිලි විභාග කිරීම

පැමිණිලි විභාග කිරීම.

18. යම් පොදු ආයතනයක කටයුතු කරගෙන යාමේ දී කරන ලද යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් උද්ගත වන්නා වූ ද යම් අදාළ භාෂාවක තරාතිරම හෝ භාවිතය පිළිබඳව වූ ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන, සෑම පැමිණිල්ලක්ම, විශේෂයෙන්ම ඒ පැමිණිල්ලෙන්—

(අ) යම් රාජ්‍ය භාෂාවක තරාතිරම පිළිගැනීම සිදු නොවන බව හෝ සිදු වී නොමැති බව; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන ව්‍යවස්ථාවේ සිට 24 වන ව්‍යවස්ථාව තෙක් වූ ව්‍යවස්ථාවල (ඒ ව්‍යවස්ථා දෙකම ඇතුළුව) ගෙනහැර දක්වා ඇති ආකාරයට යම් අදාළ භාෂාවක් භාවිතා කිරීමේ අයිතිවාසිකම හෝ භාවිතා කිරීමේ කාර්යය, පිළිගැනීම හෝ ඒ අනුව ක්‍රියා කිරීම සිදු නොවන බව හෝ සිදු වී නොමැති බව; හෝ

(ඇ) කවර හෝ අදාළ භාෂාවක තරාතිරම හෝ භාවිතය සම්බන්ධව යම් පාර්ලිමේන්තු පනතක විධිවිධාන හෝ ඒ විධිවිධාන යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක්, නැතහොත් කරන ලද යම් නියමයක් හෝ නිවේදනයක් හෝ සාදන ලද යම් අනු නීතියක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදය පිළිපැදීමෙහිලා පොදු ආයතනයක් විසින් කරන ලද යම් විධානයක් නැතහොත් ඒ ආයතනයක යම් පරිපාලනමය ව්‍යවහාරයක් අනුව ක්‍රියා නොකරන බව හෝ ක්‍රියා කර නොමැති බව; හෝ

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ පරමාර්ථවලට සහ අභිප්‍රායට ගරු නොකරන හෝ ඒ අනුව ක්‍රියා නොකරන බව නැතහොත් ගරු කර නොමැති බව හෝ ඒ අනුව ක්‍රියා කර නොමැති බව හෙළිදරව් කර ඇති අවස්ථා වන්නේ දී, කොමිෂන් සභාව විසින්, මේ පනතේ අන්තර්ගත විධිවිධානවලට යටත්ව, විභාග කළ යුත්තේ ය.

විභාග කිරීම කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කළ හැකි බව හෝ නතර කළ හැකි බව.

19. (1) කොමිෂන් සභාව—

(අ) පැමිණිල්ලේ විෂය කාරණය නොවැදගත් බවට;

(ආ) පැමිණිල්ල නිස්සාර හෝ පීඩාකාරී බවට හෝ එය සද්භාවයෙන් කරන ලද්දක් නොවන බවට;

(ඇ) පැමිණිල්ලේ විෂය කාරණය කවර හේතුවක් නිසා හෝ ස්වකීය බලතලවලට ඇතුළත් නොවන බවට; හෝ

(ඇ) විභාගයක් ආරම්භ කිරීම හෝ එය පවත්වාගෙනයාම කවර හේතුවක් නිසා හෝ අනවශ්‍ය බවට

සෑහීමට පත් වුවහොත්, ස්වකීය අභිමතය ක්‍රියාත්මක කර කොමිෂන් සභාව විසින් කවර හෝ පැමිණිල්ලක් විභාග කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ විභාග කිරීම නතර කිරීම කළ හැකි ය.

(2) යම් පැමිණිල්ලක් විමර්ශණය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ විමර්ශණය කරගෙන යෑම නැවැත්වීමට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී කොමිෂන් සභාව විසින් එවැනි තීරණයක් ගනු ලැබූ දින සිට දින 14 ක් තුළදී, ඒ තීරණය පැමිණිලිකරු වෙත දැනුම් දිය යුතු අතර ඒ තීරණයට හේතුව ලිඛිතව දැනුම් දෙන ලිපියක පිටපත ද පැමිණිලිකරු වෙත සැපයිය යුතු ය.

විමර්ෂණය කිරීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

20. (1) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ විමර්ශණය කර ගෙන යෑමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු ය.

(2) එම පැමිණිල්ලට අදාළ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීම කින් කෙළින්ම බලපෑමක් ඇති වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් නැතහොත් ඔහුගේ හෝ ඔවුන්ගේ මතයට අනුව කොමිෂන් සභාව වෙත විමර්ශණය කළ යුතු යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීම සඳහා සද්භාවයෙන් ක්‍රියාකරන පාර්ශ්වයන් වන යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) යම් පැමිණිල්ලක් රහස්‍ය සංදේශනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර අදාළ පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි විමර්ශණ පැවැත්වීමට ප්‍රයත්න දැරිය යුතු ය.

(4) මේ පනත යටතේ වූ පැමිණිල්ලක් විමර්ශනය කිරීමට පෙර එවැනි විමර්ශණයක් කිරීමට කොමිෂන් සභාව අදහස් කරන බව ඒ පැමිණිල්ලට අදාළ පොදු ආයතනයේ ප්‍රධානියා වෙත කොමිෂන් සභාව විසින් දැනුම් දිය යුතු අතර පැමිණිලිකරුගේ පූර්ව කැමැත්ත කොමිෂන් සභාව වෙත ලැබී ඇත්නම් මිස පැමිණිලිකරුගේ අනන්‍යතාවය කොමිෂන් සභාව විසින් කිසිදු තැනැත්තකුට අනාවරණය නොකළ යුතු ය.

(5) තනි පුද්ගලික පැමිණිල්ලක් පිළිබඳ විමර්ශණයක් පැවැත්වීමට කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

විමර්ශණය පැවැත්වීමට අදාළ කොමිෂන් සභාවේ බලතල.

21. මේ පනත යටතේ යම් විමර්ශණයක් හෝ සමාලෝචනයක් පැවැත්වීමට අදාළ පහත දැක්වෙන බලතල කොමිෂන් සභාව සතු වන්නේ ය :—

(අ) සාක්ෂිකරුවන් කැඳවීම සහ අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන සියලු ලේඛන ඉදිරිපත් කිරීමට බල කිරීම ;

(ආ) දිවුරුම් දෙවීම සහ දිවුරුම් පිට වාචික හෝ ලිඛිත සාක්ෂි දෙන ලෙස සාක්ෂිකරුවන්ට බල කිරීම ;

(ඇ) යම් තොරතුරක සාක්ෂිමය වටිනාකම හෝ සාක්ෂියක් අධිකරණයක දී නොඇලකිය යුතු වන්නේ වුවද ඒ ගැන නොතකා සුදුසුයයි ස්වකීය අභිමතය අනුව කොමිෂන් සභාව විසින් සලකනු ලබන තොරතුරු හෝ සාක්ෂි භාර ගැනීම, පිළිගැනීම සහ සලකා බැලීම ;

(ඈ) සුදුසුයයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් පොදු ආයතනයක පරිශ්‍රයේදී විමර්ශණය පැවැත්වීමට.

ඇහුන්කන් දීම අයිතිය ලෙස නොසැලකිය යුතු බව.

22. (1) මේ පනත යටතේ යම් විමර්ශණයක් හෝ සමාලෝචනයක් හෝ වෙනත් අධ්‍යයනයක් පැවැත්වීමේදී, යම් ඇහුන්කන් දීමක් කොමිෂන් සභාව විසින් කළ යුතු බවට නියමයක් නැති අතර ස්වකීය අයිතියක් වශයෙන් තමන්ට ඇහුන්කන් දිය යුතු යයි කියා සිටීමේ හිමිකමක් පුද්ගලයෙකුට හෝ පොදු ආයතනයකට නැත්තේ ය.

(2) යම් පුද්ගලයකු හෝ පොදු ආයතනයක් කෙරෙහි අගතිකර පිළිබිඹු කිරීමක් හෝ අගතිකර බලපෑමක් ඇති කරවන අන්දමේ වාර්තාවක් හෝ නිර්දේශයක් කිරීමට ප්‍රමාණවත් සාධක පවත්නා බව යම් විමර්ශණයක් නැතහොත් සමාලෝචනයක් කර ගෙන යන අතරතුරදී කොමිෂන් සභාවට පෙනී ගියහොත්, ඒ පුද්ගලයා හෝ පොදු ආයතනය පිළිබඳව කීමට ඇති යම් දෙයක් හෝ කරනු ලබන යම් විවේචනයක් සම්බන්ධයෙන් සාර්ථක ප්‍රතිචාරයක් දැක්වීමට අවස්ථාවක් ඒ පුද්ගලයාට හෝ පොදු ආයතනයට ලබා දීමට අවශ්‍ය යුක්තිසහගත සියලු පියවර තම විමර්ශණය සම්පූර්ණ කිරීමට පෙර කොමිෂන් සභාව විසින් ගත යුතු ය.

කොමිෂන් සභාව විසින් තම විමර්ශණය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.

23. (1) මේ පනත යටතේ විමර්ශණයක් කිරීමෙන් පසු—

(අ) ඒ විමර්ශණයට තුඩු දුන් විෂය කරුණ වූ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් සලකා බැලීම සහ ඒ පිළිබඳව ක්‍රියා කිරීම සඳහා එය ඊට අදාළ පොදු ආයතනය වෙත යොමු කළ යුතු බව ; හෝ

(ආ) පොදු ආයතනයක යම් නියමයක් නැවත සලකා බැලිය යුතු බව හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදය උල්ලංඝනය කිරීමට තුඩු දෙන නැතහොත් එසේ තුඩු දීමට ඉඩ ඇති යම් පරිචයක් වෙනස් කළ යුතු බව හෝ නවතා දැමිය යුතු බව ; හෝ

(ඇ) වෙනත් යම් ක්‍රියාවක් කළ යුතු බව

එම කොමිෂන් සභාවේ මතය වුවහොත්, ඒ මතය සහ ඊට හේතු ඒ පොදු ආයතන ප්‍රධානියා වෙත කොමිෂන් සභාව විසින් වාර්තා කළ යුතුය.

(2) මේ පනත යටතේ යම් විමර්ශණයක් පැවැත්වීමෙන් පසු ඊට තුඩු දුන් පැමිණිල්ල ස්ථුට වී නොමැති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත්, කොමිෂන් සභාව විසින් ස්වකීය මතය ඊට හේතු ද සමග එකී පැමිණිලිකරුට වාර්තා කළ යුතු ය.

(3) පැමිණිල්ලක් කිරීමෙන් පසු දින හැටක් තුළදී කොමිෂන් සභාව විසින් ස්වකීය වාර්තාව ඉදිරිපත් කළ යුතු අතර, කොමිෂන් සභාවේ පාලනයට පරිබාහිර හේතු කරණකොට ගෙන යම් විමර්ශණයක් සම්පූර්ණ කිරීමට නොහැකි වන්නේ නම්, ඒ ප්‍රමාදයට හේතු දක්වමින් අතුරු වාර්තාවක් කොමිෂන් සභාව විසින් එකී දින හැට තුළ දී ඉදිරිපත් කළ යුතු ය.

(4) ඉහත (3) වන උපවගන්තියේ විධිවිධාන කවරේ වුවද, පැමිණිල්ල ඉදිරිපත් කොට දින එකසිය විස්සක් ඇතුළත දී කොමිෂන් සභාව විසින් ස්වකීය අවසාන වාර්තාව ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාවේ පිටපතක් කොමිෂන් සභාව විසින් නොපමාවම පැමිණිලිකරු වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

(5) සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන නිර්දේශ, (3) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු වාර්තාවෙහි ඇතුළත් කරනු ලැබිය හැකි අතර, අදාළ පොදු ආයතනය විසින් ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගැනීමට අදහස් කරන පියවර කිසිවක් වේ නම් ඒවා කවරේදැයි නිශ්චිත කාලයක් තුළ දී කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලෙස ඒ ආයතනයේ ප්‍රධානියාට කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි ය.

ඇතැම් පරිවේෂණ යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කළ හැකි බව.

**24.** (1) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්,—

(අ) විමර්ශණයේ ප්‍රතිඵල එකී පැමිණිල්ල ඉදිරිපත් කළ දින සිට දින එකසිය විස්සක් තුළදී ඒ පැමිණිලිකරුට දැනුම් දී නොමැති විටක ; හෝ

(ආ) විමර්ශණය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ විමර්ශණය නතර කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇති බව 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පැමිණිලිකරුට දැනුම් දී ඇති විටක ; හෝ

(ඇ) කොමිෂන් සභාව තෘප්තිමත් වන පරිදි පැමිණිල්ල ඉදිරිපත් කර නොමැති බව 23 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඒ පැමිණිලිකරුට දැනුම් දී ඇති විටක

(අ) ඡේදයේ සඳහන් කාල පරිච්ඡේදය අවසාන වීමෙන් පසු නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් දැනුම්දීම ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත දී, 27 වන වගන්තිය යටතේ සහනයක් හෝ බේරුම් කිරීමක් සඳහා ඒ පැමිණිලිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) එවැනි සෑම ඉල්ලීමක්ම, තත් කාලයේ බලපවත්නා රීති වලට අනුකූලව, සහන හෝ බේරුම් කිරීම ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අමතනු ලබන ලිඛිත පෙත්සමක මාර්ගයෙන් ඉදිරිපත්

කරනු ලැබිය යුතු ය. එවැනි පෙත්සමක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පළමුකොට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාගත් අවසරයක් අනුව පමණක් එවැනි පෙත්සමක් සම්බන්ධයෙන් කටයුතු කරගෙන යා යුතු ය.

ඇතැම් පරිවේෂණ යටතේ පළාතේ මහාධිකරණය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි බව.

**25.** (1) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ පැමිණිල්ලක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත්තා වූ ද ඒ පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව විසින් 23 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව මගින් ස්වකීය නිර්දේශ අදාළ පොදු ආයතනයට දැනුම් දී ඇත්තා වූ ද අවස්ථාවක දී, ඒ වාර්තාව තමා වෙත ලැබී දින අනූවක් ඇතුළත දී ඒ නිර්දේශ ඒ පොදු ආයතනයේ ප්‍රධානියා විසින් ක්‍රියාත්මක නොකරනු ලැබුවහොත්, පැමිණිල්ල ඉදිරිපත් කළ තැනැත්තා පදිංචිව සිටින පළාත් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති මහාධිකරණය වෙත, 27 වන වගන්තිය යටතේ විධානයක් සඳහා ඉල්ලීමක්, ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නියමිත කාල පරිච්ඡේදය අවසාන වීමෙන් පසු දින අනූවක් ඇතුළත දී, නීතිපතිවරයාට ලියවිල්ලකින් දැනුම්දීමෙන් පසුව, ඒ තැනැත්තා හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම ඉල්ලීමක්ම ඒ මහාධිකරණය අමතන ලිඛිත පෙත්සමක් මගින් කරනු ලැබිය යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව ඒ ඉල්ලීම විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

යම් ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මාරු කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පළාත් මහාධිකරණයකට විධාන කළ හැකි බව.

**26.** පළාතක් සඳහා පිහිටුවා ඇති මහාධිකරණයක් වෙත මේ පනත යටතේ ඉදිරිපත් කර ඇත්තා වූ ද ඒ මහාධිකරණයේ විභාගයට භාජනව ඇත්තා වූ ද ඒ යම් ඉල්ලීමක්, නීතිපතිවරයා හෝ කොමිෂන් සභාව හෝ විසින් කරනු ලබන ඉල්ලීමක් මත සහ මහජන යහපත සඳහා අවශ්‍ය වන විට, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මාරු කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ මහාධිකරණයට විධාන කරනු ලැබිය හැකි ය. එවැනි විධානයක් කරනු ලැබූ විට එවැනි ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මාරු කරනු ලැබිය යුතු අතර, ඉන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කොට තීරණය කළ යුතු ය.

සාධාරණ සහ යුක්ති සහගත යයි අධිකරණය විසින් සලකනු ලබන සහන අධිකරණය විසින් ලබාදිය හැකි බව.

**27.** පහත සඳහන් නඩු කටයුතුවලදී, එනම්:—

(අ) 24 වන සහ 26 වන වගන්ති යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයට අනුකූලව හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කෙරෙන යම් නීතියක විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම යම් ආයතනයක් විසින් පැහැර හැර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකනු ලබන අවස්ථාවකදී, ඒ නඩු කටයුතුවල සියලු අවස්ථානුගත කරුණු අනුව සාධාරණ සහ යුක්ති සහගත

යයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකනු ලබන සහන ප්‍රදානය කිරීම හෝ විධාන නිකුත් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) 25 වන වගන්තිය යටතේ මහාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලදී, කොමිෂන් සභාවේ නිර්දේශ පොදු ආයතනයක ප්‍රධානියා විසින් ක්‍රියාත්මක කොට නොමැති බව මහාධිකරණය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාවේ වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස මහාධිකරණය විසින් විධාන කළ යුතු ය.

යම් අදාළ භාෂාවකින් නිල කාර්යයන් කිරීමට නියමිත රජයේ නිලධරයන් ඇතැම් අවස්ථාවල වරදකට වරදකරුවන් වන බව.

28. (1) ස්වකීය නිල කාර්යයන් කිරීමේ දී ඒ කාර්යයන්ට සම්බන්ධ කටයුතු කිරීම හෝ සංනිවේදනයක් ලැබීම නැතහොත් කිරීම හෝ, යම් ලේඛනයකින්, වාර්තාවකින්, ප්‍රකාශනයකින් හෝ වෙනත් ලියවිල්ලකින් පිටපතක් නැතහොත් උධෘතයක් නිකුත් කිරීම හෝ යම් නිශ්චිත අදාළ භාෂාවකින් කිරීමට නියමිත රජයේ නිලධරයකු විසින් ඒ සංනිවේදනය ලැබීම නැතහොත් කිරීම හෝ ඒ පිටපත හෝ උධෘතය නිකුත් කිරීම, ඒ අදාළ භාෂාවෙන් කිරීම හිතාමතාම පැහැර හරිනු ලබන හෝ නොසලකා හරිනු ලබන අවස්ථාවක ඔහු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ කිසිම නඩුවක්, නීතිපතිවරයාගේ පූර්ව අනුමතිය ඇතිව හැර, පවරනු නොලැබිය යුතු ය.

## IV වන කොටස

## විවිධ විධිවිධාන

යම් අධිකරණයක හෝ මණ්ඩලයක නඩු පැවරීමට ඇති අයිතිය මේ පනතේ විධිවිධාන මගින් නොවැළැක්වෙන බව.

29. (1) මේ පනත යටතේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කළ හැකි වේ ද ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් යම් අධිකරණයක හෝ මණ්ඩලයක නඩු පැවරීමට යම් තැනැත්තකු සතු වෙනත් යම් අයිතියකට අගතියක් හෝ හානියක් මේ පනතේ අඩංගු කිසිවකින් සිදු නොවන්නේ ය.

(2) යම් අදාළ භාෂාවක් යම් පොදු ආයතනයකදී දරන තත්ත්වය හෝ එවැනි භාෂාවක් භාවිත කිරීම සම්බන්ධයෙන් වූ යම් අධිකරණමය හෝ ඒ හා සමාන නඩු විභාගයක දී පෙනී සිටීම මහජන යහපත පිණිස වේයයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නේ නම්, අධිකරණයේ අවසරය ඇතිව, කොමිෂන් සභාව විසින් ස්වාධීන මණ්ඩලයක් වශයෙන් එවැනි නඩු විභාගයකදී අධිකරණයේ පෙනී සිටිය හැකි ය.

තමාගේ ම ඕනෑකම පිට විමර්ශනයක් භාර ගැනීමේ බලය කොමිෂන් සභාව සතු බව.

**30.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන පොදු ආයතන විසින් අනුගමනය කරනු ලබන්නේ දැයි සමීක්ෂණය කිරීම සඳහා කලින් කල තමන්ගේම ඕනෑකම පිට විමර්ශණ හෝ සමාලෝචන පැවැත්වීමට භාර ගැනීමේ බලය කොමිෂන් සභාව සතු වන අතර, එවැනි විමර්ශණවලට අදාළව කොමිෂන් සභාව විසින් කරනු ලැබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබේද යන්න සමීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් තදනන්තර විමර්ශණ හෝ සමාලෝචන තවදුරටත් පැවැත්විය හැකි ය.

(2) මේ පනතේ IV වන කොටසේ විධිවිධාන යටතේ කොමිෂන සභාව විසින් ගනු ලැබූ තීරණ සහ කරනු ලැබූ නිර්දේශ ඉතා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන පරිදි, කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාවල ඇතුළත් කිරීම හෝ විශේෂ වාර්තාවල ඇතුළත් කිරීම හෝ විශේෂ පළ කිරීම් වශයෙන් නිකුත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

රාජ්‍ය භාෂා දෙකින් කවරක් හෝ භාවිතා කිරීමට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ප්‍රකාශන කොමිෂන් සභාව විසින් නිකුත් කළ හැකි බව.

**31.** රාජ්‍ය භාෂා දෙකින් කවරක් වුවද දරන තත්ත්වයට හෝ භාවිත කිරීමට හෝ අදාළ යම් කරුණක්, පිළිබඳව අවශ්‍යයයි හෝ සුදුසුයයි කොමිෂන් සභාව, විසින් සලකනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශන නැතහොත් අධ්‍යයන පිළියෙල කිරීමෙහිලා, නිකුත් කිරීමෙහිලා හෝ ඒ පිළිබඳව ක්‍රියා ආරම්භ කිරීමෙහිලා සීමාකිරීම් කිසිවක් කොමිෂන් සභාව වෙත පැනවෙන ලෙස මේ පනතේ අඩංගු කිසිවක් කියවීම හෝ කියවා තේරුම් ගැනීම හෝ නොකළ යුතු අතර, විශේෂයෙන්ම, මහජන යහපත පිණිස අවශ්‍ය වන්නේ, නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් පොදු ආයතන යන්නෙහි අර්ථකථනය තුළට නොවැටෙන යම් ආයතනවලට එකී පරිච්ඡේදය අදාළ කිරීමට හෝ ව්‍යාප්ත කිරීමට අදාළ වන්නා වූ, යම් කරුණක් සම්බන්ධයෙන් ඒ ආයතන ඇමතීමෙහිලා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීමෙහිලා කොමිෂන් සභාව වෙත සීමා පැනවෙන ලෙස මේ පනතේ අඩංගු කිසිවක් කියවීම හෝ කියවා තේරුම් ගැනීම හෝ නොකළ යුතු ය.

කොමිෂන් සභාව විසින් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.

**32.** එක් එක් මුදල් වර්ෂය තුළදී, වෙනත් දේ අතර, කොමිෂන් සභාව විසින් 23 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**33.** කොමිෂන් සභාවේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල් ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛන ගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**34.** අල් ලස් පනතේ අර්ථානුකූලව, කොමිෂන් සභාව උපලේඛන ගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධි විධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ විධාන මත මේ පනත යටතේ කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් ආරක්ෂා කිරීම.

**35.** (1) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, යම් නිලධරයෙකු නැතහොත් යම් සේවකයකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධාන මත සද් භාවයෙන් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට හෝ ඒ සාමාජිකයාට, නිලධරයාට නැතහොත් සේවකයාට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දරනු ලැබූ යම් වියදමක් කොමිෂන් සභාව විසින් දැරිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී කොමිෂන් සභාවට ගෙවනු ලැබූ හෝ කොමිෂන් සභාව විසින් අය කරගනු ලැබූ යම් නඩු ගාස්තුවක් ඒකාබද්ධ අර මුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක දී පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් ඒ ක්‍රියාව කරන ලද්දේ සද් භාවයෙන් බව අධිකරණය විසින් නිගමනය කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා විසින් දරන ලද වියදමක් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අයකර ගනු ලැබ ඇත් නම් මිස, ඒ වියදම කොමිෂන් සභාව විසින් ඒ තැනැත්තාට ගෙවිය යුතු ය.

සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**36.** කොමිෂන් සභාවට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී කොමිෂන් සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

වැරදි.

**37.** (1) පහත දැක්වෙන යම් තැනැත්තකු, එනම්,—

(අ) මේ පනත යටතේ වූ යම් විමර්ශණයක් හෝ සමාලෝචනයක් කරගෙන යනු ලබන අතරතුර දී හෝ එවැන්නක් අවසාන කිරීමෙන් පසු, ප්‍රමාණවත් හේතුවක් නොමැතිව, කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයකු අපකීර්තියට පත් කැරෙන යම් ප්‍රකාශනයක් ප්‍රසිද්ධ කරන හෝ යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු;

(ආ) කොමිෂන් සභාවේ කාර්යාවලියට බාධා කරන යම් තැනැත්තකු ;

(ඇ) මේ පනතින් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවයකු වෙත පවරනු ලැබූ යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන යම් තැනැත්තකු ;

(ඈ) මේ පනත යටතේ වූ යම් විමර්ශණයක් හෝ සමාලෝචනයක් කරගෙන යාමේ දී—

(i) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් කැඳවීම් නියෝගයක සඳහන් කර තිබුණු ස්ථානයක දී සහ එසේ සඳහන් කර තිබුණු වේලාවක දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම යුක්ති සහගත යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් හේතුවක් නොමැතිව පැහැර හරින යම් තැනැත්තකු ;

(ii) දිවුරුම්දීම ප්‍රතික්ෂේප කරන හෝ, යථා පරිදි දිවුරුම් දීමෙන් පසු, කොමිෂන් සභාව විසින් විමර්ශණය කරනු ලබන කාරණාවලට අදාළව ඔහුට ඉදිරිපත් කළ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම යුක්ති සහගත යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින යම් තැනැත්තකු ;

(iii) යම් තැනැත්තකු සන්තකයේ හෝ ඔහුගේ බලය යටතේ ඇත්තා වූ ද කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලබන කාරණා සම්බන්ධයෙන් සත්‍යය හෙළිකර ගැනීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව අදහස් කරන්නා වූ ද යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සහ පෙන්වීම යුක්ති සහගත යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් හේතුවක් නොමැතිව ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරයි නම් හෝ පැහැර හරී නම්, එවැනි යම් තැනැත්තකු

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

(2) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වූ නඩු විභාගයක දී, ඒ වරද සමන්විත වන්නේ යයි කියනු ලබන කරුණු සඳහන් කරමින් කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක්, සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, තවදුරටත් ඔප්පු කිරීමකින් තොරව එවැනි සහතිකයක් ලෙස එය පිළිගනු ලැබිය යුත ද ඒ සහතිකයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත යුතු සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ද වේ.

38. මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබ ඇති අවස්ථාවක දී— පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන විටක, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම, ලේකම්වරයකු ම සහ නිලධර යකු ම ඒ වරද සම්බන්ධයෙන් වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සමාගමක් වන විටක, ඒ සමාගමේ සෑම හවුල්කරුවකු ම ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වකු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි සියලු උද්යෝග යෙන් තමා ක්‍රියා කළ බව ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තා වරදකරුවකු ලෙස නොසැලකිය යුතු ය.

39. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ,— අර්ථ නිරූපණය

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන හා ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"පොදු ආයතනය" යන්නෙන්—

(අ) යම් අමාත්‍යාංශයක් සහ එවැනි අමාත්‍යාංශයක් යටතේ වූ යම් දෙපාර්තමේන්තුවක් අදහස් වේ;

(ආ) යම් පොදු සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත ආයතන යක් අදහස් වේ;

(ඇ) යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් අදහස් වේ; සහ

(ඇ) ආණ්ඩුව වෙත පවරාගනු ලැබූ හෝ සම්පූර්ණයෙන් ම ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් අයිතිය දරන, යම් ව්‍යාපාරික ව්‍යවසායක්, වෙළෙඳායතනයක්, සමාගමක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

40. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.